ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 2128/30 - 2019 ජුනි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2019.06.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

සුරාබදු ආඥාපනත

අංක 04/2019 දරන සුරාබදු නිවේදනය

ස්ටිකර සහ ස්ටිකර කළමනාකරණ පද්ධතිය

(52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥාපනතේ 8 වන සහ 30 වන වගන්ති සමඟ කියවිය යුතු 32 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන රීති.

මංගල සමරවීර,
මුදල් අමාත්‍ය.

2019 ජුනි මස 20 දින,
කොළඹ 01.

රීති

1. මෙම රීති 2019 සුරාබදු (ආරක්ෂිත සලකුණු) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු ''ස්ටිකරය'' යනුවෙන් සඳහන් කරනු ලබන) I වන උපලේඛනයෙහි සඳහන් ආරක්ෂිත ස්ටිකරය, (මෙහි මින් මතු ''ආඥා පනත'' යනුවෙන් සඳහන් කරනු ලබන) (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32(ඒඅ) වගන්තියේ කාර්යය සඳහා මෙම රීති මඟින් නියම කරනු ලබන ආරක්ෂිත සලකුණුවල ස්වභාවය විය යුතු ය.

3. ආනයනකරුවකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයෙකු විසින් II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය මත ස්ටිකරය අලවා ඇත්නම් මිස, එකී සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය සන්තකයේ තබා ගැනීම, ප්‍රවාහනය කිරීම, ගබඩා කිරීම හෝ විකිණීම නොකළ යුතු ය ඃ

එසේම, මෙම රීති බලාත්මක වන දිනයේ දී II වන උපලේඛනයේ සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍යයක්, ආනයන කරන්නෙකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයකු මෙම රීති බලාත්මක වන දින සිට දින හැටක් (60) ඇතුළත, දැනටමත් පවතින, II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය මත ස්ටිකරයක් ඇලවීමට පියවර ගත යුතු ය.

1A - PG 4578 — 592 (2019/07)

මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එසේම, තවදුරටත් මෙම රීති බලාත්මක වන දිනයේ දී, II වන උපලේඛනයේ සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය තොගයන් සහිත වෙළෙන්දන් විසින් මෙම රීති බලාත්මක වන දින සිට දින හැටක් (60) ඇතුළත II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන එම ද්‍රව්‍ය මත ස්ටිකරයක් ඇලවීමට පියවර ගත යුතු ය.

4. (මෙහි මින්මතු ''කොමසාරිස් ජනරාල්වරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින්-

(අ) බදු හෝ තීරු බදු නොගෙවන ලද මත්පැන් භාවිතය වැළැක්වීම ;

(ආ) සුරාබදු ආදායම් තවදුරටත් සුරක්ෂිත කිරීම ; සහ

(ඇ) ව්‍යාජ මත්පැන් වැළැක්වීම,

යන කාර්යයන් සඳහා ස්ටිකරය සහ ස්ටිකර කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම, කළමනාකරණය කිරීම, නිකුත් කිරීම, අධීක්ෂණය කිරීම සහ පරීක්ෂා කිරීම සඳහා වගකිව යුතු ය.

5. (1) ස්ටිකර ලබා ගැනීමේ කාර්යය සඳහා ආනයනකරුවෙකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයකු විසින් කොමසාරිස් ජනරාල්වරයා වෙත අතින් (Manually) හෝ විද්‍යුත් ක්‍රමයෙන් ඉල්ලුම් කළ යුතු ය.

(2) ආනයන හා සම්බන්ධ ලේඛන සහ කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි එවැනි වෙනත් ලේඛන, ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(3) ආනයනකරුවකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයකු විසින්, සෑම මාසයක කාලපරිච්ඡේදයක් ආරම්භ වීමට පෙර, එකී ආනයනකරු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයකු විසින් භාවිතා කිරීමට අපේක්ෂිත ස්ටිකර ප්‍රමාණය පිළිබඳව අවම වශයෙන් දින හැටක (60) පුරෝකථනයක් ඉදිරිපත් කළ යුතු ය.

(4) (අ) එකී ආනයනකරුවකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයකු විසින් -

(i) II වන උපලේඛනයේ සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් ගෙවිය යුතු සුරාබද්ද ගෙවා නොමැති නම් ;

(ii) II වන උපලේඛනයේ සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍යවල ලේබල හා පැකේජයන් සඳහා අනුමැතිය ලබාගෙන නොමැති නම් ;

(iii) මෙහි සඳහන් රීතින්ට අනුකුල නොවේ නම් ; සහ

(iv) ආඥාපනතේ විධිවිධානවලට අනුකුල නොවේ නම්,

II වන උපලේඛනයේ සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය මත ඇලවීමට අදාළ ස්ටිකර ලබාගැනීම සඳහා වන ඉල්ලුම්පත්‍රය කොමසාරිස් ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කළ හැකි ය.

(ආ) මෙම රීතියේ හි (1) වන ඡේදයේ සඳහන් ඉල්ලුම් පත්‍රය කොමසාරිස් ජනරාල්වරයා විසින්, අනුමත කිරීමෙන් පසු, ස්ටිකර ලබා ගැනීමේ කාර්යය සඳහා ආනයනකරු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයා විසින් මෙම රීතින් හි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු ගෙවිය යුතු ය.

6. ආනයනකරුවකු සම්බන්ධයෙන් වන විටදී, අදළ ලේඛන කටයුතු අවසන් කිරීමට පෙරාතුව යම් කොන්දේසිවලට යටත්ව කොමසාරිස් ජනරාල්වරයා විසින් ස්ටිකර නිකුත් කළ හැකි ය.

7. 5 වන රීතියේ (4)(ආ) ඡේදයේ සඳහන් ගාස්තු ලබාගැනීමෙන් පසු, කොමසාරිස් ජනරාල්වරයා විසින් අදළ එම ස්ටිකර ප්‍රමාණය ආනයනකරු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයා වෙත නිකුත් කළ යුතු ය.

8. (1) බන්ධිත ගුදමේ හෝ තොග වෙළඳ බලපත්‍රලත් ස්ථානයන්හිදී (ර. බි. 3) II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍යය මත ස්ටිකර, ඇලවීම, ගබඩා කිරීම සහ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ආනයනකරු වගකිව යුතු ය.

(2) II වන උපලේඛනයෙහි සඳහන් සුරා බද්දට යටත් වන ද්‍රව්‍යය මත ස්ටිකර, ඇලවීම, ගබඩා කිරීම සහ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී නිෂ්පාදකයා වගකිව යුතු ය.

(3) මෙම රීතියෙහි (2) වන ඡේදයෙහි සඳහන් ස්ටිකර සක්‍රීය කිරීමේ වගකීම ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් දැරිය යුතු ය.

9. ගුවන් තොටුපළවල ක්‍රියාත්මක වන්නා වූ තීරුබදු රහිත සාප්පු වෙත නිකුත් කරනු ලබන, II වන උපලේඛනයේ සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය මත බන්ධිත ගුදම්වල දී ස්ටිකර ඇලවීමේ ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකා රේගුව වගකිව යුතු අතර -

(අ) ශ්‍රී ලංකා රේගුවේ අධීක්ෂණය යටතේ II වන උපලේඛනයේ සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය මත ස්ටිකරය අලවා ඇත්නම් මිස ; සහ

(ආ) ශ්‍රී ලංකා රේගුව විසින් එකී ස්ටිකරය සක්‍රීය කර ඇත්නම් මිස,

II වන උපලේඛනයේ සඳහන් සුරාබද්දට යටත් වන කිසිදු ද්‍රව්‍යයක් ගුවන් තොටුපළවල ක්‍රියාත්මක වන්නා වූ තීරු බදු රහිත සාප්පු වෙත නිකුත් කරනු නොලැබිය යුතු ය.

එසේ වුව ද, ර. බි. 3 බලපත්‍රය යටතේ II වන උපලේඛනයේ සඳහන් සුරා බද්දට යටත් වන ද්‍රව්‍ය ආනයනය කරනු ලබන ආනයනකරුවන් විසින්, තොග වෙළඳාමට අවසර ලත් (ර. බි. 3) බලපත්‍ර ලත් ස්ථානයන් හි දී සුරාබදු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ එකී සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය මත ස්ටිකර ඇලවිය යුතු අතර එය ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව විසින් සක්‍රීය කරනු ලැබිය යුතු ය.

10. II වන උපලේඛනයේ සඳහන් සුරාබද්දට යටත්වන ද්‍රව්‍යයක් මත අලවා ඇති ස්ටිකරය එහි මුල් ලක්ෂණවලට කිසියම් වෙනසක් ඇති වන ලෙස නිරාවරණය කිරීම, පලුදු කිරීම, වෙනස් කිරීම, හානි කිරීම, විනාශ කිරීම හෝ ඇතිල්ලීම නොකළ යුතු යඃ

එසේ වුව ද, මෙම ඡේදය -

(i) සද්භාවයෙන් සිදුකරන පෞද්ගලික පරිභෝජනය සඳහා ;

(ii) ස්ථානීය පරිභෝජනය කිරීමේ කාර්යය සඳහා මත්පැන් විකිණීමට අවසර ලබාගත් බලපත්‍රලාභියකුට 1979.12.07 දිනැති අංක 66 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළවූ අංක 661 දරන සුරාබදු නිවේදනයට අනුකූලව එක් වර්ගයකට අයත් අරක්කු බෝතල් දෙකක් පමණක් විවෘත කර තබාගැනීමට බලයලත් අවස්ථාවක දී,

අදාළ නොවිය යුතු ය.

11. ආනයනකරුවකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයකු විසින් -

(අ) II වන උපලේඛනයේ සඳහන් සුරා බද්දට යටත් වන ද්‍රව්‍යය මත කොමසාරිස් ජනරාල්වරයා විසින්, කලින් කලට තීරණය කරනු ලැබිය හැකි පැහැදිලිව පෙනෙන ස්ථානයක ස්ටිකරය ඇලවිය යුතු ය ;

(ආ) ස්ටිකර මිල දී ගැනීම, ස්ටිකරවල වියදම දරා ගැනීම, ස්ටිකර ඇලවීමේ උපකරණවල වියදම දරා ගැනීම, ස්ටිකර ඇලවීමේ කාර්ය සඳහා වන වියදම දරා ගැනීම සහ එම උපකරණ ගැලපෙන පරිදි සකස් කිරීම හෝ අනුවර්තනය කිරීම, එම ආම්පන්න ගැලපෙන පරිදි සකස් කිරීම හෝ අනුවර්තනය කිරීම සහ එක් එක් නිෂ්පාදන පෙළවල්වල (production lines) අලුත් හෝ නවීකරණය කරන ලද පද්ධති ස්ථාපනය කිරීම සහ ඒකාබද්ධ කිරීම සඳහා අවශ්‍ය පරිශ්‍රයන් ඇතුළු යම් වෙනත් අදාළ මෙහෙයුම් වියදම් දරා ගත යුතු ය ;

(ඇ) අඛණ්ඩව ඉදිරි කටයුතු සිදු කිරීමට සහ අවශ්‍ය විටෙක ප්‍රයෝජනයට ගැනීම සඳහා ප්‍රමාණවත් අමතර ස්ටිකර ඇලවීමේ උපකරණ සහ ස්ටිකර ඇලවීමේ මෙහෙයුම් සඳහා අවශ්‍ය උපාංග මිල දී ගත යුතු ය ;

(ඈ) එකී උපකරණ සහ උපාංග හොඳ තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු ය ;

(ඉ) ස්ටිකර ඇලවීමේ උපකරණ සහ ස්ටිකර ඇලවීමේ මෙහෙයුම් සඳහා භාවිතා කරන උපාංගවල සියලුම යාන්ත්‍රික සහ මෙහෙයුම් දෝෂ සම්බන්ධයෙන් කඩිනමින් පිළියම් යෙදිය යුතු ය ;

(ඊ) අවශ්‍ය විටෙක ප්‍රයෝජනයට ගැනීම සඳහා අවශ්‍ය වන උපකරණ සහ උපාංග සපයා ගැනීම සහ ගබඩා කිරීම කළ යුතු ය ;

(උ) උපකරණ ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් යම් දෝෂයක් ඇති වූ වහාම ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවට දැන්විය යුතු ය ;

(ඌ) මෙම රීතින්හි IV සහ V වන උපලේඛනවල දක්වා ඇති ආකෘතියට අනුකූලව බඩු වට්ටෝරු පොත් සහ ලේඛන පවත්වාගෙන යා යුතු ය ; සහ

(එ) II වන උපලේඛනයෙහි සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍යයන්හි වාර්ෂික නිෂ්පාදන ප්‍රමාණයන් හෝ ආනයනය කරනු ලබන ප්‍රමාණයන් පිළිබඳ පුරෝකථනයක් පිළියෙල කළ යුතු ය.

12. ඊට අමතරව, බලපත්‍රලාභී නිෂ්පාදකයකු විසින් -

(i) නිෂ්පාදන සැපයුම් ක්‍රියාවලිය බාධාවකින් තොරව සිදුකර ගෙන යාම සඳහා ප්‍රමාණවත් සංඛ්‍යාවක නිෂ්පාදන පෙළවල් සහ ස්ටිකර ඇලවීමේ උපකරණ ප්‍රමාණවත් සංඛ්‍යාවක් පවත්වාගෙන යා යුතු ය ; සහ

(ii) කාලානුරූපී වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් පුරෝකථනය කරන ලද සාමාන්‍ය ස්ටිකර ප්‍රමාණය අනුව අවම වශයෙන් දින පහකට (05) ප්‍රමාණවත් වන පරිදි ස්ටිකර තොගයක් පවත්වාගෙන යා යුතු ය.

13. II වන උපලේඛනයේ සඳහන් සුරා බද්දට යටත් වන ද්‍රව්‍ය දැනටමත් ආනයනය කරන හෝ නිෂ්පාදනය කරන යම් ආනයනකරුවකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයකු විසින් මෙම රීති බලාත්මක වන දිනට පෙර දින සිට පිළිවෙළින් දින තිහක (30) සහ දින හැටක (60) කාලපරිච්ඡේදය ඇතුළත, මෙම රීතීන්ට අනුකූලව ස්ටිකර ඇලවීමේ උපකරණ සහ අනෙකුත් උපාංග ලබා ගැනීම, ස්ථාපනය කිරීම, පරීක්ෂා කිරීම සහ ක්‍රියාත්මක කිරීම කළ යුතු ය.

14. (1) මෙම රීතිවල කාර්යය සඳහා මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් -

(අ) සභාපතිවරයා විය යුතු භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයෙකු ;

(ආ) ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා ;

(ඇ) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් නම් කරන ලද නිලධරයකු;

(ඈ) ශ්‍රී ලංකා රේගුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් නම් කරන ලද නිලධරයකු ; සහ

(ඉ) ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ (සැපයුම් දම නියාමන) නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්

ගෙන් සමන්විත කමිටුවක් පත්කළ යුතු ය.

(2) කමිටු සාමාජිකයන් වසරක කාලයක් සිය ධුරය දැරිය යුතු අතර මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කාලයක් සඳහා කමිටුවේ නිල කාලය දීර්ඝ කරනු ලැබිය හැකි ය ᐧ

(3) කමිටුවේ යම් රැස්වීමක් සඳහා සාමාජිකයන් තිදෙනෙකුගේ සණ පූර්ණයක් පැවතිය යුතු ය ;

(4) අවම වශයෙන් මාසයකට එක් වරක්වත් කමිටුව රැස්විය යුතු නමුත් අවශ්‍ය විය හැකි සැමවිටකම කමිටුව රැස්විය යුතු ය ;

(5) කමිටුවේ කාර්යයන් සම්බන්ධයෙන් වන කාර්ය පටිපාටිය කමිටුව විසින් නියාමනය කරනු ලැබිය හැකි ය ;

(6) කොමසාරිස් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලබන පරිදි සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධරයකු හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහු වෙනුවෙන් බලයලත් වෙනත් යම් නිලධරයකු රැස්වීමට සහභාගී විය යුතු ය ; සහ

(7) කමිටු රැස්වීම්වල සාකච්ඡා කරන ලද කරුණුවල දැඩි රහස්‍යභාවය පිළිබඳ සැමවිටකම කමිටු සාමාජිකයන් විසින් සහතික විය යුතු ය.

15. කමිටුවේ කාර්යයන් වන්නේ -

(අ) කලින් කලට ස්ටිකරවල ආකෘතිය සහ ස්වභාවය තීරණය කිරීම ;

(ආ) ස්ටිකර ඉල්ලුම් කිරීමේ, සැකසීමේ, ඇණවුම් කිරීමේ, මුද්‍රණය කිරීමේ, ගබඩා කිරීමේ, නිකුත් කිරීමේ හා බෙද හැරීමේ ක්‍රමවේද කලින් කලට තීරණය කිරීම ;

(ඇ) කලින් කලට ආනයනකරුවන් සහ බලපත්‍රලාභී නිෂ්පාදකයන් විසින් පවත්වාගෙන යා යුතු බඩු වට්ටෝරු පොත් සහ ලේඛනවල ආකෘතිය තීරණය කිරීම ;

(ඈ) නිෂ්පාදන පරීක්ෂා කර බැලීම සහ ඒ පිළිබඳව සොයා බැලීම සම්බන්ධ ක්‍රමවේද, කාර්ය පටිපාටි සහ පිළිවෙල කලින් කලට තීරණය කිරීම ;

(ඉ) ස්ටිකරවල විවෘත, ආවෘත සහ ව‍්‍යෝහාරික සලකුණු සහතික කිරීමේ ක්‍රමවේද කලින් කලට තීරණය කිරීම ;

(ඊ) ඉල්ලුම මත පදනම්ව ස්ටිකර ඇණවුම් කිරීම සඳහා අනුමැතිය ලබාදීම ;

(උ) ස්ටිකරවල භෞතික හා මෙහෙයුම් කාර්යසාධනය ඇගයීම සහ වෙනත් යම් නව නිර්දේශ ක්‍රියාත්මක කිරීම ;

(ඌ) ස්ටිකර නිර්මාණය කිරීමේ, මුද්‍රණය කිරීමේ සහ ඒ හා සම්බන්ධ වෙනත් සියලු කාර්යයන් හි ක්‍රියාවලිය හා සම්බන්ධ කරුණු හා තත්ත්වය තහවුරු කිරීම සඳහා නිසි මාර්ගෝපදේශ සහ උපදෙස් ලබාදීම ;

(එ) මේ රීතිවල කාර්යය සඳහා අවශ්‍ය විය හැකි, පැවරී ඇති හෝ ආනුෂංගික වන වෙනත් යම් කර්තව්‍යයක් ඉටු කිරීම ; සහ

(ඒ) මුදල් විෂයය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත කාර්තුමය පදනමින් කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කිරීම.

16. ආනයනකරුවකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයකු විසින්, අවස්ථාවෝචිත පරිදි, ස්වකීය බලපත්‍රලාභී හෝ බලයලත් පරිශ්‍රවල හෝ බන්ධිත ගුදම්වල හෝ තොග වෙළඳ බලපත්‍ර ලත් ස්ථානවල (ර.බී. 3) ස්ටිකර ගබඩා කිරීම සඳහා සුරක්ෂිත සහ ප්‍රමාණවත් ගබඩා පහසුකම් සැලැස්විය යුතු ය.

17. (1) කොමසාරිස් ජනරාල්වරයා විසින් පහත දැක්වෙන අවස්ථාවල දී ආඥාපනතේ 35 වන වගන්තියට අනුකූලව ස්ටිකර, ආම්පන්න, උපකරණ, වාහන හෝ ද්‍රව්‍ය තහනමට ගනු ලැබිය යුතු ය:-

(අ) ස්ටිකර ව්‍යාජ ලෙස සකස් කර ඇති අවස්ථාවක ;

(ආ) කොමසාරිස් ජනරාල්වරයා වෙත ආපසු භාරදිය යුතු ස්ටිකර එසේ ආපසු භාර දී නොමැති ; හෝ එම ස්ටිකර ලබාදෙන ලද්දේ යම් තැනැත්තන්ට ද එම තැනැත්තන් නොවන වෙනත් යම් තැනැත්තන් සන්තකයේ තිබී එම ස්ටිකර සොයා ගනු ලැබූ අවස්ථාවක ;

(ඇ) මෙම රීතිවල නියමයන් සපුරා නොමැති II වන උපලේඛනයේ සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය ගබඩා කිරීම, සැඟවීම හෝ ප්‍රවාහනය කිරීම සඳහා වාහනයක් භාවිත කර ඇති අවස්ථාවක ;

(ඈ) ව්‍යාජ ලෙස සැකසූ ස්ටිකර නිෂ්පාදනය කිරීම සඳහා උපකරණ හෝ යන්ත්‍ර භාවිත කර ඇති අවස්ථාවක ; හෝ

(ඉ) II වන උපලේඛනයේ සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය මත ව්‍යාජ ලෙස සැකසූ ස්ටිකර ඇති අවස්ථාවක හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූල නොවන ආකාරයකින් අලවන ලද ස්ටිකර ඇති අවස්ථාවක හෝ මේ රීතිවලට අනුකූල පරිදි ස්ටිකර නොමැති අවස්ථාවක.

(2) යම් ආරවුලක් ඇති වූ අවස්ථාවක එය විමර්ශනය කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් කමිටුවක් පත් කරනු ලැබිය හැක.

18. II වන උපලේඛනයේ සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය ආනයනකරුවකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයකු විසින්, පහත දැක්වෙන අවස්ථාවල දී භාවිත නොකරන ලද ස්ටිකර කොමසාරිස් ජනරාල්වරයා වෙත ආපසු භාර දිය යුතු යː-

(අ) බලපත්‍රලාභී නිෂ්පාදකයා විසින් II වන උපලේඛනයේ සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය නිෂ්පාදනය නැවැත් වූ අවස්ථාවක ;

(ආ) ස්ටිකර පත්‍රවල හෝ රීල්වල දෝෂ ඇති අවස්ථාවක ; හෝ

(ඇ) කොමසාරිස් ජනරාල්වරයා විසින්, එම ස්ටිකර භාවිත නොකළ යුතු බවට ප්‍රකාශ කර ඇති අවස්ථාවක,

19. හානි වූ ස්ටිකර බලයලත් නිලධරයකු විසින් ප්‍රත්‍යක්ෂණය කිරීම සඳහා ආනයනකරුවකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයකු විසින් සුරැකිව තබා ගත යුතු ය.

20. කිසිදු ආනයනකරුවකු හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයකු විසින් කොමසාරිස් ජනරාල්වරයාගේ පූර්ව අනුමැතිය නොමැතිව එකී ආනයනකරුට හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයාට නිකුත් කර ඇති ස්ටිකර එකී තැනැත්තාටම අයත් වෙනත් නිෂ්පාදන හෝ ආනයන ඒකකයකට මාරු කරනු නොලැබිය යුතු ය.

21. නව හෝ නවීකරණය කරන ලද ස්ටිකර හෝ ස්ටිකර කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කරන අවස්ථාවක දී, එකී නව හෝ නවීකරණය කරන ලද ස්ටිකර හෝ ස්ටිකර කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීමට අවම වශයෙන් දින හැටකට (60) පෙර, කොමසාරිස් ජනරාල්වරයා විසින්, II වන උපලේඛනයේ සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය ආනයනකරුවන්ට හෝ බලපත්‍රලාභී නිෂ්පාදකයන්ට ඒ පිළිබඳව ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

22. බලපත්‍රලාභී නිෂ්පාදකයකු හෝ ආනයනකරුවකු විසින් -

(අ) යම් නිෂ්පාදන පෙළවල් ක්‍රියාත්මක නොවීමක් සිදුවීමෙන් පැය විසිහතරක් ඇතුළත එම නිෂ්පාදන පෙළවල් ක්‍රියාත්මක නොවීම පිළිබඳ කොමසාරිස් ජනරාල්වරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය ;

(ආ) පරිශ්‍රයේ ස්ථාපනය කර ඇති පද්ධතියේ සංරක්ෂණය හා ආරක්ෂාව පිළිබඳ වගකිව යුතු ය ;

(ඇ) යම් මෙහෙයුම් දෝෂයක් හෝ ආරක්ෂාව කඩවීමක් සිදුවී පැය විසි හතරක් ඇතුළත එම මෙහෙයුම් දෝෂය හෝ ආරක්ෂාව කඩවීම පිළිබඳ කොමසාරිස් ජනරාල්වරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය ;

(ඈ) II වන උපලේඛනයේ සඳහන් සුරාබද්දට යටත් වන ද්‍රව්‍යවල ලේබල් සහ පැකේජ සඳහා කොමසාරිස් ජනරාල්වරයාගෙන් අනුමැතිය ලබා තිබිය යුතු ය ;

එසේ වුවද මෙම රීතිය තීරුබදු රහිත සාප්පු සඳහා ආනයන කරනු ලබන II වන උපලේඛනයේ සඳහන් සුරාබද්දට යටත් ද්‍රව්‍ය සඳහා අදාළ නොවිය යුතු ය ;

(ඉ) II වන උපලේඛනයේ සඳහන් සුරා බද්දට යටත් වන ද්‍රව්‍යයන් සඳහා දැනටමත් අනුමැතිය දී ඇති ලේබල හා පැකේජ ප්‍රතිනිර්මාණය කරන විට ලේබල් හා පැකේජ වල යම් වෙනසක් පිළිබඳ යටත් පිරිසෙයින් දින තිහකට (30) පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රකාශ කරනු ලැබිය යුතු ය ;

(ඊ) (i) අකර්මන්‍ය නිෂ්පාදන පෙළවල් නැවත සක්‍රීය කිරීමක දී,

(ii) නිෂ්පාදන පෙළවල් නිෂ්ක්‍රීය කිරීමක දී,

(iii) නඩත්තු කටයුතු සිදුකිරීමක දී හෝ නිෂ්පාදන පෙළවල් ප්‍රතිස්ථාපනය කිරීමක දී සහ

(iv) නව නිෂ්පාදන පෙළවල් ස්ථාපනය කිරීමක දී

ස්ථාපනය කිරීමට හෝ ඉවත් කිරීමට යටත් පිරිසෙයින් දින තිහකට (30) පෙර කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු ය.

23. (1) කිසිම තැනැත්තකු විසින් මෙහි සඳහන් රීති උල්ලංඝනය කරමින් -

(අ) II වන උපලේඛනයේ සඳහන් කරනු ලැබූ සුරා බද්දට යටත් වන යම් ද්‍රව්‍යයක අලවා ඇති ස්ටිකර මත මුද්‍රණය කිරීම හෝ විකෘති කිරීම ;

(ආ) මේ රීති යටතේ ස්ටිකර ඇලවීමෙන් නිදහස් කළ අවස්ථාවක හැර ස්ටිකර අලවා නැති II වන උපලේඛනයේ සඳහන් සුරා බද්දට යටත් වන ද්‍රව්‍ය සන්තකයේ තබා ගැනීම ;

(ඇ) කොමසාරිස් ජනරාල්වරයාගේ අවසරයකින් තොරව ස්ටිකර ලබා ගැනීම හෝ ස්ටිකර ලබා ගැනීමට උත්සාහ කිරීම ;

(ඈ) කොමසාරිස් ජනරාල්වරයාගේ අවසරයකින් තොරව, ස්ටිකර මුද්‍රණය කිරීම, සෑදීම හා වෙනත් කිසියම් ආකාරයකින් නිර්මාණය කිරීම ;

(ඉ) කොමසාරිස් ජනරාල්වරයාගේ අවසරයකින් තොරව මුද්‍රණය කරන ලද, සාදන ලද හෝ වෙනත් යම් ආකාරයකින් ලබාගත් යම් ස්ටිකරයක් ළඟ තබා ගැනීම ;

(ඊ) මේ රීතීන්ට අනුකූලව අලවන ලද ස්ටිකර රහිතව II වන උපලේඛනයේ සඳහන් සුරා බද්දට යටත් වන ද්‍රව්‍ය සන්තකයේ තබා ගැනීම, රැගෙන යාම, බෙද හැරීම, විකිණීම හා විකිණීමට ප්‍රදර්ශනය කිරීම ; සහ

(උ) ව්‍යාජ ස්ටිකර අලවන ලද, II වන උපලේඛනයේ සඳහන් සුරා බද්දට යටත්වන ද්‍රව්‍ය සන්තකයේ තබා ගැනීම, රැගෙන යාම, බෙද හැරීම, විකිණීම හා විකිණීමට ප්‍රදර්ශනය කිරීම,

නොකළ යුතු ය.

24. ස්ටිකර සහ ස්ටිකර කළමනාකරණ පද්ධතිය අධීක්ෂණය කිරීම සඳහා මුදල් විෂය පැවරී ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් විශේෂ විගණන කණ්ඩායමක් පත් කරනු ලැබිය හැකි ය.

25. මෙහි සඳහන් රීති උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන්, ආඥාපනතේ 27, 47, 48, 50 සහ 56 වන වගන්තිවල විධිවිධාන අවස්ථාවෝචිත පරිදි අදාළ කරගත යුතු ය.

26. මේ රීතීන්හි, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස -

''සුරා බද්දට යටත් වන ද්‍රව්‍යය'' යන්නට, (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥා පනත මඟින් ඊට දී ඇති අර්ථයම පවතී.

''ආරක්ෂිත ස්ටිකරය'' යන්නෙන්, I වන උපලේඛනයේ විශේෂිතව දක්වා ඇති ආරක්ෂිත සලකුණුවල ස්වභාවය අදහස් වේ.

''ආනයනකරු'' යන්නට මෙම රීතින් හි II වන උපලේඛනයේ විශේෂිතව දක්වා ඇති සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 10 වන වගන්තිය යටතේ බලපත්‍රයක් දරන්නකු අදහස් වේ.

''තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම්'' යන්නට, පරිගණක සේවාදායකය (server), මෘදුකාංග, මෙහෙයුම් පද්ධති, රැහැන් සහිත හා රැහැන් රහිත ජාල, ඉලෙක්ට්‍රොනික උපාංග, පර්යන්ත, සංරචක, මෙවලම් සහ අනෙකුත් අදාළ වෙනත් චල්‍ය, විචල්‍ය, සක්‍රීය, අක්‍රීය හා අතින් ක්‍රියාකරන සංරචක අන්තර්ගත වේ.

''බලපත්‍රධාරී නිෂ්පාදකයකු'' යන්නට මෙම රීතින් හි II වන උපලේඛනයේ විශේෂිතව දක්වා ඇති සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 15 වන වගන්තිය යටතේ බලපත්‍රයක් දරන්නකු අදහස් වේ.

''ස්ටිකරය'' යන්න ආරක්ෂිත ස්ටිකරය අදහස් වේ.

''ස්ටිකර කළමනාකරණ පද්ධතිය'' යන්නට ආරක්ෂිත ස්ටිකර කළමනාකරණය කිරීම සඳහා භාවිතා කරනු ලබන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් අදහස් වේ.

''වෙළෙන්දකු'' යන්නට මෙම රීතින් හි II වන උපලේඛනයේ විශේෂිතව දක්වා ඇති සුරාබද්දට යටත් වන ද්‍රව්‍ය විකිණීම, විකිණීම සඳහා සන්තකයේ තබා ගැනීම හෝ ප්‍රදර්ශනය කිරීම සඳහා (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 18 වන වගන්තිය යටතේ බලපත්‍රයක් දරන්නකු ද අදහස් වේ.

(2 වන රීතිය)

I වන උපලේඛනය

ආරක්ෂිත සලකුණ	*විස්තරය*
ස්ටිකර	(1) දිග (මිමි 100), පළල (මිමි 20) සහ බර (වර්ග මීටරයට ග්‍රෑම් 60) දිග (මිමි 80), පළල (මිමි 16) සහ බර (වර්ග මීටරයට ග්‍රෑම් 60) දිග (මිමි 50), පළල (මිමි 10) සහ බර (වර්ග මීටරයට ග්‍රෑම් 60) විශ්කම්භය (මිමි 20) සහ බර (වර්ග මීටරයට ග්‍රෑම් 60) ඉහත සලකුණුවල වෙනස්වීමේ නම්‍යතාව සහිතව. (2) සහතික කිරීම, හඳුනා ගැනීම, පලුදු කිරීමට නොහැකි වන ලෙස සකස් කිරීම සහ ඉබේ ඇලවෙන, ඉබේ විනාශ වන සහ නැවත භාවිත කළ නොහැකි ස්ටිකරවල ඇතුලත් ආරක්ෂිත සලකුණු සහ වෝහාරික බව, ආවෘත බව, විවෘත බව සහ ඊට අදාළ අනෙකුත් ආරක්ෂිත සලකුණු (3) හොලොග්‍රැෆික් ආරක්ෂිත සලකුණු

(3 වන රීතිය)

II වන උපලේඛනය

අංකය	*වර්ගය*
01	ආනයනික විදේශීය මත්පැන්
02	දේශීයව නිෂ්පාදිත විදේශීය මත්පැන්
03	දේශීය මත්පැන්

(5(4)(ආ) රීතිය)

III වන උපලේඛනය

අංකය	*වර්ගය*	*ගාස්තු*
01	එක ස්ටිකරයකට	රු. 2.00

(11 (උ) වන රීතිය)

IV වන උපලේඛනය

ස්ටිකර පිළිබඳ බඩු වට්ටෝරුව

දිනය	අතැති ස්ටිකර ප්‍රමාණය	ලැබූ ස්ටිකර ප්‍රමාණය	බෝතල් කළ හෝ ආනයනය කළ මත්පැන් සඳහා නිකුත් කළ ස්ටිකර ප්‍රමාණය	හානි වූ ස්ටිකර ප්‍රමාණය	සක්‍රීය කරනු ලැබූ ස්ටිකර ප්‍රමාණය

(11 (උ) වන රීතිය)

V වන උපලේඛනය

හානි වූ ස්ටිකර පිළිබඳ බඩු වට්ටෝරුව

හානි වූ ස්ටිකර ප්‍රමාණය	හානි වූ ස්ටිකරවල කාණ්ඩ අංක	විනාශ කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලිපියේ අංකය හා දිනය	හානි වූ ස්ටිකර විනාශ කරන දිනය	හානි වූ ස්ටිකර විනාශ කිරීමේ කාර්යයේ නියුතු නිලධරයන්ගේ නම්/තනතුරු/ අත්සන	නියෝජිතයාගේ හෝ බලපත්‍රලාභියාගේ අත්සන

07 - 503

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.